ජූනි 2026

# INFORMATION

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පුවත් හසුන














## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ නව විදුහල්පතිතුමාගේ නිලස්ථාපනය

2026 මාර්තු 26 වන දින කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල දෙව් මැඳුරේ පැවති විශේෂ දේව මෙහෙයකදී, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි නව විදුහල්පති ලෙස නතානියෙල් සෝමනාදන් මහතා නිලස්ථාපනය කරන ලදී. වත්මන් සහ හිටපු කවුන්සිල සාමාජිකයන්, අධ්‍යාපන පීඨ සාමාජිකයන්, කාර්ය මණ්ඩලය, සිසුන්, ආදි සිසුන්, සහෘදයන්, මෙන්ම ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ (NCCSL), ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදානී සන්ධානයේ (NCEASL) සහ අනෙකුත් බයිබල් පාසල්වල නියෝජිතයන් ඇතුළු කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රජාවේ නියෝජිතයන් ඊට සහභාගී විය.

නතානියෙල් 2019 සිට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ගුරුවරයෙකු ලෙසත්, 2025-2026 දක්වා නියෝජ්‍ය විදුහල්පති ලෙසත් සේවය කර ඇත. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ වීටන් විද්‍යාලයෙන් උපාධිධාරියෙකු වන අතර එක්සත් රාජධානියේ බර්මින්හැම් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අපේක්ෂකයෙකි.

ඔහු ස්කයිලර් සමඟ විවාහ වී සිටින අතර, ඔවුන්ට මේවා නම් ළදරු දියණියක් සිටී.

මෙම නිලස්ථාපනය කිරීමේ දේව මෙහෙයේදී, ඇමරිකා එක්සත් ජනපදයේ ගෝර්ඩන්-කොන්වෙල් දේවධර්ම ශාස්ත්‍රාලයේ, ක්‍රිස්තියානි ආචාරධර්ම පිළිබඳ කීර්තිමත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ ගෞරව සම්මානිත සභාපතිවරයෙක් වූ, ආචාර්ය ඩෙනිස් හොලින්ජර් විසින් මෙම අවස්ථාව සඳහා පණිවිඩයක්ද; හිටපු විදුහල්පති ආචාර්ය අයිවෝ පුබාලන් විසින් දෙවියන්වහන්සේට කෘතඥතා ප්‍රකාශයක්ද; කවුන්සිලයේ සභාපති ගෞ. පූජ්‍ය ඩිලෝරාජ් කනගසබේ විසින් නව විදුහල්පතිවරයා සඳහා පැවරුම් ප්‍රකාශයද; කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ප්‍රාරම්භක සභාපති අජිත් ප්‍රනාන්දු විසින් ආලේප කිරීමේ යාච්ඤාවද; නව විදුහල්පතිතුමා විසින් තම ප්‍රතිචාරයද ගෙන එන ලදී.

**නිලස්ථාපනය කිරීමේ දේව මෙහෙය නැරඹීමට ක්ලික් කරන්න.** YouTube

නව විදුහල්පතිතුමාගේ පණිවිඩය

## බලගතු නිහතමානීකම



**නතානියෙල් සෝමනාදන්**

නායකත්වය වෙනස් වීම, ව්‍යාකූලත්වය, මංමුළා වීම සහ එදිරිවාදිකම් සඳහා අවස්ථා විය හැකිය. අසතුටුදායක ලෙස සිදු වූ මෙවැනි වෙනස් වීම් ගැන, විශේෂයෙන් බයිබලයේ සාවුල් සහ දාවිත්ගේ වෘත්තාන්තය දන්නා අප බොහෝ දෙනෙකුට මෙය අලුත් ප්‍රවෘත්තියක් නොවනු ඇත.

කෙසේ වෙතත්, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය ගැන කතා කරන්නේ නම්, අපට සැමරීමට කරුණු රාශියක් තිබෙන බව මම සතුටින් පවසමි. මෙම නායකත්වයේ වෙනස් වීමට සම්බන්ධ වූ සැමට, එය දෙවියන් වහන්සේ ගෞරවයට පැමිණෙවූ, අභිමානවත් අවස්ථාවක් විය. අපට සිතාගත නොහැකි ආකාරයෙන්, ඉන් දෙවියන් වහන්සේගේ අනුග්‍රහය සහ සැපයීම විදහා දැක්වීම ගැන අපි කෘතඥ වෙමු.

මාර්තු 26 වන දින පවත්වන ලද, නව විදුහල්පතිතුමාගේ නිලස්ථාපන දේව මෙහෙය, මා විස්තර කරන කාරණයේ විශ්වීය සිදුවීම් දාමක කුඩා ඡායාවකි.

2 වන පිටුවෙන් ඉදිරියට



1 වන පිටුවේ සිට ඉතිරිය...

එය, ස්වාමීන් වහන්සේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය තුළින් මෙතෙක් කර ඇති දේ ගැන කෘතඥතාවත්, අනාගතයේදී උන් වහන්සේ කරන්නට යන දේ ගැන කුතුහලයෙන් යුත් උද්යෝගයත් එකට මිශ්‍රවූ අලංකාර ඉතා සංවේදී දේව මෙහෙයක් විය. සභා සහ නිකායික නායකයන්, කවුන්සිල සාමාජිකයන්, අධ්‍යාපන පීඨ සාමාජිකයන්, සිසුන්, කාර්ය මණ්ඩලය සහ සහෘදයන් රැසක් පෞද්ගලිකව සහ සජීවී විකාශනය හරහා දේව මෙහෙයට සහභාගී වීම විශේෂ වරප්‍රසාදයක් විය. ලෝක සභාව සහ එහි මෙහෙවර වෙනුවෙන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි පැවැත්ම නැවත තහවුරු කිරීමට එය කදිම අවස්ථාවක් විය.

සුමට හා හිතකර වෙනසකට මඟ පෑදීම ගැන, මාගේ පූර්වගාමියා (මට පෙර ධූරය දැරූ) වූ ආචාර්ය අයිවෝ පුබාලන්ට මම බොහෝ සෙයින් කෘතඥ වෙමි. එතුමා තම නායකත්වය තුළ ස්ථිර අවංකභාවය සහ නිහතමානීකම පිළිබඳ ඉහළ ප්‍රමිතියක් පෙන්නුම් කර ඇති අතර, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි විදුහල්පතිවරයා ලෙස වසර 27 කට වැඩි කාලයක් ආදර්ශවත් හා ඵලදායී සේවයක් සම්පූර්ණ කිරීම පිළිබඳව අපි එතුමාට සුබ පතන්නෙමු. ආචාර්ය පුබාලන්ගේ ඊළඟ දේවසේවා අදියර, දේශීය හා ගෝලීය සභාවට ඊටත් වඩා විශාල ආශීර්වාදයක් වන්නට යන බවට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පවුලේ අපට කිසිදු සැකයක් නැත.

අප්‍රේල් පළමුවන දින මම ධූරයට පත් වීමි. මෙයට පෙර සහ එතැන් සිට, මාගේ භූමිකාව ගැන සිතන විට නැවත නැවතත් මාගේ මතකයට ආ ශුද්ධ ලියවිලි පාඨයක් වන්නේ 1 කොරින්ති 4 ය. මෙම පරිච්ඡේදය, නායකයන්ගේ පෞරුෂත්ව වටා කල්ලි ගැසීම නවත්වන ලෙස කොරින්තියේ කිතුනුවන්ට ඒත්තු ගැන්වීම සඳහා පාවුලු තුමා ගොඩනඟන දීර්ඝ තර්කයේ කොටසකි. නායකයන් දැකිය යුතු ආකාරය -- ඒකරාශී විය හැකි පෞරුෂයන් ලෙසවත්, උස් තැනක හෙබවිය යුතු ප්‍රභූවරයන් ලෙසටවත් නොව, "ක්‍රිස්තුන් වහන්සේගේ සේවකයන් සහ දෙවියන් වහන්සේගේ අබිරහස් පිළිබඳ භාරකරුවන්" ලෙස (1 පදය) පාවුලු තුමා නැවත අර්ථ දක්වයි. ඊට වඩා අඩු හෝ වැඩි යමක් නැත. එමනිසා, පාවුලු තුමා අනුව, තම නායකයන් ගැන පුරසාරම් දොඩන කිතුනුවන්ගේ දේවසේවා කැඳවීම කුමක් වුවද, ඔවුන් අනුග්‍රහයේ එකම ප්‍රභවය වන ක්‍රිස්තුන් වහන්සේ තුළ තමන්ගේම පොහොසත්කම පිළිබඳ දුර්වල අවබෝධයක් ඇතුව සිටින බව හෙළි කරයි.


සියල්ලක්ම දීමනාය. සියලුම දීමනා ලැබුණු ඒවා මිස එකක්වත් තමන් විසින්ම උපයා නොගත් බව පාවුලු තුමා නායකයන්ට මතක් කර දෙයි.

කිතුනුවන් තමන්ගේම ප්‍රතිරූපයට අනුව දේවල් සහ මිනිසුන් පිදිය යුතු ලෙස සලකන විට (7 පදය), ඔවුහු දෙවියන් වහන්සේ උසස් කරනවා වෙනුවට තමාම උසස් කර ගනිති. නිහතමානීව දීමනා ලබා නොගන්නා කල සහ ඒවා අයිතිවාසිකම් ලෙස සලකන විට ඒවා අප වන්දනාමාන කරන පිළිම බවට පත්වේ. ශ්‍රේෂ්ඨත්වය ගැන පුරසාරම් දොඩනවා වෙනුවට, පාවුලු තුමා එහි ප්‍රතිවිරුද්ධ දෙය සඳහා ආදර්ශවත් වෙයි (8-13 පද). ක්‍රිස්තුන් වහන්සේ තුළ තමන් කවුදැයි දකින පිණිස මිනිසුන්ට උපකාර කිරීමත්, සුබ අස්න මනාව කළමනාකරණය කිරීමත් නායකත්වයේ කැඳවීමයි. දෙවියන් වහන්සේගේ අභිරහස් නිදහසේ සහ මැදිහත්වීමකින් තොරව හෙළිදරව් කිරීමෙන්, සියලු දෙනාටම ක්‍රිස්තුන් වහන්සේ තුළ පමණක් සොයාගත හැකි නිදහස, ආරක්ෂාව සහ තත්වය සොයා ගැනීමට හැකිවේ. අන් අයට ක්‍රිස්තුන් වහන්සේ තුළ පොහොසත් වීමට හැකි වන පරිදි, නායකයා අන්තිමයා සහ පහත්ම කෙනා වීමට තෝරා ගනී. නායකයා නිර්මාණය කරන්නේ යැපීම නොව බලගැන්වීමයි.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය තුළින් සුබ අස්න දේවසේවය වේගවත් කිරීම සඳහා ජනතා දීමනා බලගැන්වීමත්, සම්පත් දීමනා රැකබලා ගැනීමත්, මෙම නව වාරය සඳහා මාගේ කාර්යභාර යැයි මම සිතමි. සභාව, විවිධ ජාතික හා සභා අර්බුදවලට දිගටම මුහුණ දෙන අතර, සභාවට අද්විතීය දීමනා ලබා දීමේ හැකියාවක් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය සතුව ඇතැයි මට ඒත්තු ගොස් තිබේ. ඒ දේ කිරීමට අපට හැකියාව ලැබෙන පිණිස මා සමඟ එක්ව යාච්ඤා කරන ලෙස මම ඔබට ආරාධනා කරමි.

දෙවියන්වහන්සේට පමණක් මහිමය වේවා!

## CTS වාර සංග්‍රහය දැන් Sri Lankan Journals Online (SLJOL) වෙබ් අඩවියෙන් ලබාගත හැකිය




කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සඟරාවේ (JCTS) 19 වන වෙළුම, Sri Lankan Journals Online (SLJOL) හි ප්‍රකාශයට පත් කිරීමත් සමඟ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය තවත් සන්ධිස්ථානයකට එළඹියේය.

ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් කළමනාකරණය කරනු ලබන SLJOL, ප්‍රධාන ජාතික විද්වත් ප්‍රකාශන වේදිකාවක් ලෙස අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින අතර, මේ වන විට එහි සඟරා 173 ක්, කලාප 2,950 ක් සහ ලිපි 25,163 ක් ඇත.

2001 සිට වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද JCTS තුළින්, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ගුරුභවතුන් මෙන්ම ලොව පුරා සිටින ප්‍රමුඛ පෙළේ විද්වතුන් විසින් ලියන ලද ලිපිවලින් නිවැරදි දේවධර්මීය ආවර්ජනා සහ ශාස්ත්‍රීය ලිපි පළ කර ඇත.

JCTSහි වෙළුම් 19ම නොබෝ කලකින් SLJOL හි පළ කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

**මෙම වෙබ් අඩවියට පිවිසීමට මෙතැන ක්ලික් කරන්න**

ගුරු මණ්ඩල පුවත්

## අභිනන්දනය: ආචාර්ය මනෝ ඉමෑනුවෙල්

වසර 25 ක සේවා කාලය සැමරීම



ආචාර්ය මනෝ 2001 දී ගණකාධිකාරිණිය ලෙස සහ කථිකාචාර්යවරියකු ලෙස කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට සම්බන්ධ වූවාය. ඉක්මනින්ම ඇයට අධ්‍යයන සම්බන්ධීකාරක තනතුර පවරන ලද අතර, 2005 දී ශාස්ත්‍රාලයීය පීඨාධිපතිනිය ලෙස පත් කරනු ලැබුවාය. මෙම තනතුරේ වසර 14ක සේවා කාලයකින් පසු, ඇය දැන් ශාස්ත්‍රීය ප්‍රවර්ධන අංශාධිපතිනිය ලෙස සේවය කරන අතර, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ගුරු මණ්ඩලය සහ අධ්‍යාපනික සම්පත් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින්, පූර්ණ කාලීන ගුරුවරියක් ලෙස, ඉගැන්වීම් සහ ලේඛන කටයුතුවල දිගටම නියැළෙන්නීය.

## CTIA සහ JAET ඒකාබද්ධ සම්මන්ත්‍රණයේ ප්‍රධාන කථිකයා ලෙස ආචාර්ය අයිවෝ පූබාලන්



ආසියාවේ දේවධර්ම විමර්ශන මධ්‍යස්ථානය (CTIA) සහ ආසියානු දේවධර්ම සංගමයේ, ආසියානු ධර්මදානී දේවධර්ම විද්වත් වාර සංග්‍රහය (ATA's Journal of Asian Evangelical Theology) විසින් පෙබරවාරි මාසයේදී සංවිධානය කරන ලද ඒකාබද්ධ සම්මන්ත්‍රණයේ ප්‍රධාන කථිකයා වූයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ හිටපු විදුහල්පති ආචාර්ය අයිවෝ පූබාලන්ය.




'හැඩගස්වන ලද සහ යවන ලද' යන්න සම්මන්ත්‍රණයේ තේමාව විය. "ආසියාවේ පුරෝගාමී සේවාවන් සඳහා නායකත්වය: පාවුලු තුමාගේ ආකෘතිය" සහ "21 වන සියවසේ මුල් පරම්පරා ක්‍රිස්තියානි ධර්මයේ සංසිද්ධිය: දේවධර්මීය සහ දේවගැති ප්‍රතිචාරය" යන මාතෘකා යටතේ ආචාර්ය අයිවෝ ප්‍රධාන දේශන පැවැත්වීය.

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල මූලස්ථානයෙහි බාහිර කථිකාචාර්යවරුන්



**ග්‍රේස් අල්-සෞබි, PhD**


ලන්ඩන් දේවධර්ම විද්‍යාලයෙන් දේවධර්ම අධ්‍යාපනය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇති, බෙත්ලෙහෙමේ දේවධර්ම අධ්‍යාපනඥවරියක්ය. ඇය 'සංස්කෘතික දෘෂ්ටිකෝණයෙන් ධර්මදූතනය' පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව ඉගැන්වූවාය.



**චුන් ලී සෝ, EdD**

සිංගප්පූරු බයිබල් විද්‍යාලයේ උපදේශන පාසලේ මනෝචිකිත්සකයෙකු, අධීක්ෂකවරයෙකු, පුහුණුකරුවෙකු සහ අනුබද්ධ ගුරුවරයෙකුද වන ඇය, 'කම්පනය සහ අපයෝජනය සඳහා උපදේශනය' පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව ඉගැන්වූවාය.

**ඩෙනිස් පී හොලින්ජර්, PhD**



ගෝර්ඩන්-කොන්වෙල් දේවධර්මීය ශාස්ත්‍රාලයේ ක්‍රිස්තියානි ආචාරධර්ම පිළිබඳ කීර්තිමත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු සහ ගෞරව සම්මානිත සභාපතිවරයෙක් වූ, ඒ මහතා, 'ලිංගික ආචාර ධර්ම සහ ජෛව වෛද්‍ය ආචාරධර්ම පිළිබඳ ගැටළු' පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව ඉගැන්වීය.

**බෙනට් ලෝරන්ස්, PhD**



ඉන්දියානු, ආසියාතික දේවධර්ම සංගමයේ කලාපීය ලේකම්වරයා, ලෙස කටයුතු කරන අතර පිලිපීනයේ දේවධර්ම උපාධි පාසලේ උපාධිධාරියෙක් වන ඔහු, '1 කොරින්ති' පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව ඉගැන්වීය.

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රජාව

## සුභ පැතුම්



සහකාර පීඨාධිපති ජූලියන් දේවදාසන් මහතාට, මාර්තු මාසයේදී දකුණු අප්‍රිකානු දේවධර්මීය ශාස්ත්‍රාලය විසින් දේවධර්ම ශාස්ත්‍රපති (MTh) උපාධිය පිරිනමන ලදී. ඔහුගේ නිබන්ධනය සඳහා ඔහු ශ්‍රී ලංකාවේ පළමු පරම්පරාවේ ඇදහිලිවන්තයන් සඳහා දේවගැති උපදේශනය යන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරමින්, ආත්ම විමසීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේය.

මැයි මාසයේදී, ඔහු ක්‍රිස්තියානි ආගමික වෘත්තිකයන්ගේ සංගමයෙන් (ACRP) සහ දකුණු අප්‍රිකානු දේවගැති සහ අධ්‍යාත්මික උපදේශකයන් සඳහා වූ කවුන්සිලයෙන් (CPSC) ක්‍රිස්තියානි දේවගැති උපදේශනය පිළිබඳ ආගමික විශේෂඥයෙකු ලෙස සහතිකය ලබා ගත්තේය.



කථිකාචාර්ය සහ ප්‍රාදේශීය අධ්‍යයන සම්බන්ධීකාරක (උතුරු මැද පළාත), දිලිප් ගුණවීර මහතා 2025 නොවැම්බර් මාසයේදී, ශ්‍රී ලංකාවේ ජාතික සමාජ සංවර්ධන ආයතනයෙන්, සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MSW) සාර්ථකව සම්පූර්ණ කළේය.

ඔහුගේ නිබන්ධනය 'ග්‍රාමීය පාසල් අධ්‍යාපනයට සමාජ මාධ්‍ය භාවිතයේ බලපෑම' ගවේෂණය කළේය. දිලිප් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ආදි ශිෂ්‍යයෙකි (BTh 2013).

## කාර්ය මණ්ඩලය



පරිපාලන නිලධාරිනී (උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය) ප්‍රශාන්ති ප්‍රනාන්දු මහත්මිය, මාර්තු මාසයේදී ලංකා බයිබල් විද්‍යාලය සමඟ හවුල්කාරිත්වයෙන් DAI Lanka ආයතනයෙන් සංවිධානාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තාය.

## පාලක මණ්ඩලය

### ඇල්ෆා ශ්‍රී ලංකා පාඨමාලාවේ මෙරට අධ්‍යක්ෂවරයා ලෙස ප්‍රශාන් ද මෙල් පත් කර ඇත



ඇල්ෆා ශ්‍රී ලංකා පාඨමාලාවේ අධ්‍යක්ෂවරයා ලෙස ප්‍රශාන් ද මෙල් (කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කවුන්සිලයේ භාණ්ඩාගාරික) පත් කරන ලදී. ඇල්ෆා පාඨමාලාව යනු ලිහිල්, විනිශ්චය නොකරන පරිසරයක් තුළ ක්‍රිස්තියානි ඇදහිල්ලේ මූලික කරුණු හෙළිදරව් කිරීම සඳහා නිර්මාණය කර ඇති ගෝලීය අන්තර්-ක්‍රියාකාරී සැසි මාලාවකි. එය සම්පූර්ණයෙන්ම නොමිලේ වන අතර සැක කරන්නන්, නව ඇදහිලිවන්තයන් හෝ අධ්‍යාත්මිකත්වය සහ ජීවිතයේ අරුත ගැන කුතුහලයෙන් සිටින ඕනෑම අයෙකු සඳහා විශේෂයෙන් සකස් කර ඇත.

### මයිකා ග්ලෝබල් හි ගෝලීය අධ්‍යක්ෂ ලෙස රොෂාන් මෙන්ඩිස් පත් කර ඇත



කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කවුන්සිලයේ සාමාජික රොෂාන් මෙන්ඩිස්, මෙම වසර මුලදී මයිකා ග්ලෝබල් හි ගෝලීය අධ්‍යක්ෂක ලෙස පත් කරන ලදී. මයිකා ග්ලෝබල් යනු මානුෂීය ප්‍රතිචාරය, සංවර්ධනය, නිර්මාණ රැකවරණය සහ පෙනී සිටීමේ ක්ෂේත්‍රවල ක්‍රියාකාරී කිතුනුවන්ගේ ජාත්‍යන්තර ජාලයකි.

## යාපනයේ සිට තරුණ නායිකාවක් ඇයගේ කතන්දරය බෙදා ගනී....

යුද්ධයේ දරුණු ඉතිරිවීම් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ උපන් මා හැදී වැඩුනේ ඒ විනාශයේ සලකුණු (මතකයන්) අතරය. එහෙත් දිව්‍ය කැඳවීම සහ ආත්මික හැඩගැස්වීම තුළින්, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට පැමිණි මාගේ බිඳුණු ආරම්භය, බලාපොරොත්තුවලින් සපිරි සේවයකට හැඩගැසුණි. දෙවියන් වහන්සේ තවමත් කතා කරනවාද, තවමත් යවනවාද, තවමත් වෙනසක් ඇති කරනවාදැයි සිතන බොහෝ දෙනෙකුට මාගේ ජීවිතය ආලෝක ධාරාවක් වී ඇත.

2018 දී, මා ඩිප්ලෝමා පාඨමාලා ශිෂ්‍යයාවක ලෙස කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පිළිගන්නා ලදී. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය යනු හුදෙක් උපාධිලාභීන් වීම නොවන බව මම ඉක්මනින්ම දැනගතිමි. එය ගොඩනැගීම සම්බන්ධ විය. ආරම්භයේ සිටම, මට නමස්කාරයේ පූජනීය රිද්මය, ප්‍රජා ජීවිතය, දේවධර්මීය පොරබැදීම් සහ ස්වයං ආවර්ජණය මට දැනුණි. එය මගේ මුළු අනන්‍යතාවම නැවත හැඩගස්වන පරිවර්තනයක ආරම්භය විය.

(ඇය 2025 ස්තුති දීමේ සහ සහතික පත් ප්‍රදානය කිරීමේ උපාධි ප්‍රදානෝත්සවයේදී දේවධර්ම ඩිප්ලෝමාව ලබා ගත්තාය)

විශේෂයෙන් ප්‍රථම වතාවට, තිරසාර දේවධර්මීය අධ්‍යාපනයක නිරත වන සිසුන්ගේ වෙනස්වීම් පිළිබඳ මෙවැනි කතන්දර, අපි වසර ගණනාවක් පුරා අසා ඇත්තේමු. දෙවියන් වහන්සේ යමෙකු තබා ඇත්තේ සභාවේද, ව්‍යාපාරික ලෝකයේද නැත්නම් නිවසේ ද, ඉහළම මට්ටමින් දෙවියන් වහන්සේට සේවය කිරීමට ඔවුන් සම්පූර්ණයෙන්ම සන්නද්ධ වන පිණිස, සෑම ඇදහිලිවන්තයෙකුටම මෙම අධ්‍යාපනය සහ ආත්මික ගොඩනැගීම ලබා ගැනීමට හැකි වනු ඇතැයි අපි යාච්ඤා කරමු.

**ශ්‍රී ලංකාවේ දේවධර්ම අධ්‍යයනයට මහත් උනන්දුවක් දක්වන සිසුන් හට, තම අධ්‍යයන කටයුතු කරගෙන යාමට මූල්‍යමය දුෂ්කරතා බාධාවක් වී ඇත.**

## අදම මාර්ගයක් සාදන්න!

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයට ඔබ ලබා දෙන පරිත්‍යාගය, ඵලදායී ක්‍රිස්තියානි සේවය සඳහා ඇදහිලිවන්තයන් සන්නද්ධ කිරීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය හට උපකාරී වනු ඇත.**

### ඔබට වෙනසකට දායක විය හැකි අන්දම:

1. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයට දීර්ඝ කාලීනව දායක වන්න - මාසිකව/කාර්තුමය වශයෙන්
2. වරක් පරිත්‍යාගයක් කරන්න

### ඔබට පහත දැක්වෙන ආකාරවලින් ඔබගේ දීමනාව ලබා දිය හැකිය:

**බැංකු හුවමාරුවක් ලෙස /තැන්පතුවක් ලෙස**

බැංකුව: හැටන් නැෂනල් බැංකුව (කොහුවල ශාඛාව)
ගිණුමේ නම: Colombo Theological Seminary (Pvt) Ltd
ගිණුම් අංකය: 129010017539
SWIFT Code: HBLILKLXOO1
යොමුව: ඔබේ නම/ප්‍රතිඥාව
* ඔබ සෘජු මුදල් ප්‍රේෂණයක් කරන්නේ නම්, කරුණාකර rochelle@cts.lk ලිපිනයට ඒ බව දන්වන්න.

**චෙක්පත්**

යොමු කරන්න: කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය (පුද්ගලික) සමාගම (Colombo Theological Seminary (Pvt) Ltd) - (Account Payee)
යොමු ලිපිනය: විදුහල්පති | කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය
189 දුටුගැමුණු වීදිය, කොහුවල, ශ්‍රී ලංකාව

* ඔබගේ ත්‍යගය ලැබුණු බවට නිල කුවිතාන්සියක් සමඟ වහාම දන්වනු ඇත.

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාරිනී රොෂෙල් හේකල්-රණසිංහ මහත්මිය අමතන්න.
+94 77 350 2930 | rochelle@cts.lk

